ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය - මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨය

ශාස්ත්‍රවේදී තෙවන වසර ප්‍රථම අර්ධවාර්ෂික පරීක්ෂණය - 2017 ජුලි/ අගෝස්තු

ආර්ථික විද්‍යාව

# ECON 3120.03 – සංවර්ධන න්‍යාය

---

- කාලය පැය තුන (03) යි.
- ප්‍රශ්න පත්‍රය කොටස් තුනකින් (03) සමන්විත ය. ඒ ඒ කොටස් යටතේ දී ඇති උපදෙස් පරිදි ප්‍රශ්න තෝරාගෙන ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.
- අත් අකුරු පැහැදිලි විය යුතුය.

---

## I කොටස

[එක් (01) ප්‍රශ්නයකට පමණක් පිළිතුරු සපයන්න]

1. ආර්ථික සංවර්ධනය සෑම ආර්ථිකයක ම ප්‍රධාන අපේක්ෂාවක් වේ.

   i). සංවර්ධන ආර්ථික විශ්ලේෂණයන්ට අනුව ආර්ථික සංවර්ධනයෙහි අවශ්‍යතාව හා වැදගත්කම කුමක් දැයි සහේතුකව පැහැදිලි කරන්න.

   ii). ආර්ථික සංවර්ධනය මැනීමේ දී සමාජ සංවර්ධනය මගින් මනිනු ලබන්නේ කුමක් දැයි කෙටියෙන් පැහැදිලි කරන්න.

   iii). සංවර්ධන සංකල්පයේ විකාශනයට අනුව 70 දශකයේ සිදුවූ විශේෂ පරිවර්තනය පැහැදිලි කරන්න.

   iv). ආර්ථික සංවර්ධනය මැනීමේ දී සංයුක්ත දර්ශකයන්ගේ අවශ්‍යතාව නිදසුනක් ආශ්‍රයෙන් විභාග කරන්න.

   (එක් කොටසකට ලකුණු 05)

2. අඩු සංවර්ධනයක් සහිත රටවල ආර්ථික සංවර්ධනය සංවර්ධන ආර්ථික විද්‍යාවේ විෂය පථය ලෙස භාවිතයට ගැනේ.

   i). අඩු සංවර්ධනයක් සහිත රටවල පොදු ලක්ෂණ සංක්ෂිප්තව දක්වන්න.

   ii). ආදායම් ව්‍යාප්ති විෂමතාව අඩු දියුණු රටවල් මුහුණ දෙන ප්‍රධාන ගැටලුවක් වන බව ගිනි සංගුණකය ආශ්‍රයෙන් පැහැදිලි කරන්න.

   iii). භූගෝලීය ව්‍යාප්තිය අනුව අඩු දියුණු රටවල් සම්බන්ධයෙන් ඔබ හඳුනාගන්නා විශේෂත්වය කුමක් ද? හේතු සහිතව පෙන්වා දෙන්න.

   iv). ''ඇතැම් සංවර්ධන දර්ශකයන් අනුව අඩු දියුණු රටවල් සංවර්ධිත මට්ටමේ පවතී'' මෙම ප්‍රකාශය සමඟ ඔබ එකඟ වන්නේ ද? පැහැදිලි කරන්න.

   (එක් කොටසකට ලකුණු 05)

## II කොටස

[ප්‍රශ්න දෙකකට (02) පමණක් පිළිතුරු සපයන්න]

3. සම්භාව්‍ය ආර්ථික සංවර්ධන මතවාදයන් සෙසු මතවාදයන් සඳහා මූලික වී ඇත.

    i). ආර්ථික සංවර්ධනය පිළිබඳ ඇඩම් ස්මිත්ගේ අදහස් ඒකාංශික න්‍යායක් වශයෙන් දක්වනු ලබන්නේ ඇයි? හේතු දක්වන්න.

    ii). රිකාඩෝගේ අදහස්වලට අනුව රටක සංවර්ධනය සඳහා වන අවශ්‍යතාවන් පැහැදිලි කරන්න.

    iii). අඩු දියුණු රටවල සංවර්ධන ක්‍රියාවලිය උදෙසා සම්භාව්‍ය මතවාදයන්හි අදාලත්වය විවේචනාත්මකව විශ්ලේෂණය කරන්න.

(එක් කොටසකට ලකුණු 05)

4. විවිධ ආර්ථික සංවර්ධන න්‍යායන් රටක විවිධ සංවර්ධන අවශ්‍යතාවන් කෙරෙහි යොමුකෙරේ.

    i). "රටක සංවර්ධනය සඳහා ආයෝජන යොදාගත යුත්තේ මහා පරිමාණ නිෂ්පාදන ඉලක්ක කරගනිමිනි" සුදුසු සංවර්ධන ආකෘතියක් ආශ්‍රයෙන් පැහැදිලි කරන්න.

    ii). ආර්ථික සංවර්ධනයෙහි සමබර වර්ධනය යන්නෙන් අදහස් වන්නේ කුමක් ද?

    iii). "රටක ආර්ථික වර්ධනයේ වේගය වෙනස්වනු ලබන්නේ බාහිරස්ථ සාධකවල බලපෑමෙනි" අදාල සංවර්ධන මොඩලය ආශ්‍රයෙන් විභාග කරන්න.

(එක් කොටසකට ලකුණු 05)

5. ආර්ථික සංවර්ධනයේ දී ව්‍යුහාත්මක වෙනස්කම් ඇතිවීම සාමාන්‍ය ලක්ෂණයකි.

    i). "ආර්ථික සංවර්ධනයේ දී ශ්‍රම සංක්‍රමණය සඳහා හේතුවන්නේ ව්‍යාපාරිකයින් ලාභය ආයෝජනය කිරීම යි" එකඟ වන්නේ ද? රූප සටහන් සහිතව පැහැදිලි කරන්න.

    ii). ටොඩාරෝ දක්වන ශ්‍රම සංක්‍රමණයේ සාධක මොනවාද? කෙටියෙන් පැහැදිලි කරන්න.

    iii). ආර්ථිකයක ද්විත්වභාවය යන්නෙන් අදහස් වන්නේ කුමක් ද?

(එක් කොටසකට ලකුණු 05)

## III කොටස

[ප්‍රශ්න දෙකකට (02) පමණක් පිළිතුරු සපයන්න]

6. ආර්ථික සංවර්ධනය පිළිබඳ නූතන මතවාදයන් වඩාත් සංකීර්ණ වේ.

i). රටක ආර්ථික සංවර්ධනයේ දී විදේශ ණය හා ආධාරවල කාර්යභාරය පැහැදිලි කරන්න.

(ලකුණු 06)

ii). ශ්‍රී ලංකාවේ සංවර්ධන ක්‍රියාවලිය සඳහා නිදහසින් පසු ලබාගත් විදේශ සහයෝගය පිළිබඳ ඇගයීමක් කරන්න.

(ලකුණු 09)

7. වර්තමාන පරම්පරාව අනාගත පරම්පරා සඳහා සම්පත් සංරක්ෂණය කළයුතු වේ.

i). ඉහත ප්‍රකාශයෙන් අදහස් වන්නේ කුමක් ද? එවැනි තහවුරු කිරීමක අවශ්‍යතාව කුමක් ද? පැහැදිලි කරන්න

(ලකුණු 06)

ii). "තිරසාර සංවර්ධනය ප්‍රබල ලෙස පරිසරය කෙරෙහි යොමු කෙරේ." පැහැදිලි කරන්න.

(ලකුණු 09)

8. සංවර්ධනය මැන දැක්වීම වර්තමානයේ දී වඩාත් සංකීර්ණ වී ඇත්තේ එහි චිරස්ථායී බව තහවුරු කිරීම වඩාත් සංකීර්ණ වන බැවිනි.

i). මානව සංවර්ධනය හා තිරසර මානව සංවර්ධනය යන සංකල්පයන් අතර වෙනස ඔබ හඳුනාගනු ලබන්නේ කෙසේ ද?

(ලකුණු 06)

ii). "ඉහළ මානව සංවර්ධනයක් හිමි රටවල වුවද තිරසර මානව සංවර්ධනය පහළ මට්ටමක පැවතිය හැකිය" මෙම ප්‍රකාශය නිදසුන් සහිතව පැහැදිලි කරන්න.

(ලකුණු 09)

***********